Annexure 01

# සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය - නර්තන හා නාට්‍ය කලා පීඨය

## නර්තන උපාධි පාඨමාලා සඳහා බඳවා ගැනීමේ

## යෝග්‍යතා පරීක්ෂණය - 2026

**01 අපේක්ෂකයන් සඳහා පොදු උපදෙස් පත්‍රය**

i. අදාළ දින නියමිත වේලාවට පෙර පරීක්ෂණය සඳහා විශ්වවිද්‍යාලයීය පරීක්ෂණ මණ්ඩලය වෙත පැමිණිය යුතු ය.

ii. නර්තනයට යෝග්‍ය පුහුණු ඇඳුම් කට්ටලයකින් සැරසී පරීක්ෂණය සඳහා ඉදිරිපත් විය යුතු වේ.

iii. විදේශීය නර්තන ඉදිරිපත් කිරීමේ දී පමණක්, අදාළ සංගීත ඛණ්ඩය "Pen Drive" එකක් ඉදිරිපත් කළ යුතු ය.

iv. බෙර වාදනය සඳහා ඉදිරිපත් වන අපේක්ෂකයන්ට වාදන භාණ්ඩ රැගෙන ආ හැකි ය.

**02 විභාග ක්‍රමවේදය**

පහත නිර්ණායක යටතේ ලකුණු ලබාදීම සිදු කෙරේ.

1. ගායනය කුසලතා ඉදිරිපත් කිරීම
2. ප්‍රාසංගික කුසලතා ඉදිරිපත් කිරීම - ප්‍රධාන
3. ප්‍රාසංගික කුසලතා ඉදිරිපත් කිරීම - උප ප්‍රධාන
4. නිර්මාණාත්මක කුසලතා ඉදිරිපත් කිරීම
5. වාචික පරීක්ෂණයට මුහුණ දීම

**2.1 ගායනය කුසලතා ඉදිරිපත් කිරීම** **(ලකුණු 10), ( කාලය විනාඩි 02)**

අපේක්ෂකයාගේ අභිමතය පරිදි තෝරාගත්, ජන ගායනයක් හෝ සාම්ප්‍රදායික ගායනයක් හෝ ඉදිරිපත් කළ යුතු ය.

2.2 ප්‍රාසංගික කුසලතා ඉදිරිපත් කිරීම - ප්‍රධාන (ලකුණු 40), ( කාලය විනාඩි 03)

පළමු කොටස (ලකුණු 30)

උඩරට/ පහතරට/ සබරගමු සම්ප්‍රදායන්ට අයත් ගායනය සහිත නර්තනයක් ඉදිරිපත් කිරීම.

හෝ

උඩරට/ පහතරට/ සබරගමු නර්තන සම්ප්‍රදායන්ට අයත් බෙර වාදනයක් ඉදිරිපත් කිරීම.

දෙවන කොටස (ලකුණු 10)

පළමු කොටස සඳහා නර්තනයක් ඉදිරිපත් කළේ නම්, එම සම්ප්‍රදායට අයත් වාදනයක් ඉදිරිපත් කිරීම.

හෝ

පළමු කොටස සඳහා වාදනයක් ඉදිරිපත් කළේ නම්, එම සම්ප්‍රදායට අයත් නර්තනයක් ඉදිරිපත් කිරීම

2.3 ප්‍රාසංගික කුසලතා ඉදිරිපත් කිරීම - උප ප්‍රධාන (ලකුණු 20), ( කාලය විනාඩි 03 )

පළමු ඉදිරිපත් කිරීම වශයෙන් තෝරාගත් සම්ප්‍රදාය හැර දේශීය හෝ විදේශීය හෝ නර්තනයක් නැතිනම් වාදනයක් ඉදිරිපත් කළ යුතු ය.

2.4 නිර්මාණාත්මක කුසලතා ඉදිරිපත් කිරීම (ලකුණු 15 ), ( කාලය විනාඩි 02)

පරීක්ෂක මණ්ඩලය විසින් ලබා දෙන තේමාවක් යටතේ ස්වනිර්මාණ අංගයක් ඉදිරිපත් කිරීම. (ගායන/ වාදන/නර්තන/රංගන/ අභිරූපණ )

2.5 වාචික පරීක්ෂණය (ලකුණු 15 )

කලාව පිළිබඳ කාලීන දැනුම, අවබෝධය සහ ආකල්ප මැන බලන ප්‍රශ්නයක් ඔබ වෙත ඉදිරිපත් කෙරේ.

03 ඇගයීම් නිර්ණායක

| | ඉදිරිපත් කිරීම | ඇගයීම් නිර්ණායකය | ලකුණු | සමස්ත ලකුණු |
|---|---|---|---|---|
| 2.1 | ගායනය කුසලතා ඉදිරිපත් කිරීම | ශ්‍රැතිය | 02 | |
| | | උචිත නාද මාලාව | 04 | |
| | | ඉදිරිපත් කිරීම | 04 | 10% |
| 2.2. | ප්‍රාසංගික කුසලතා ඉදිරිපත් කිරීම - ප්‍රධාන | **පළමු කොටස -නර්තනය** | | |
| | | සාම්ප්‍රදායික අනන්‍යතා ලක්ෂණ | 06 | |
| | | නිවැරදි අංගහාර භාවිතය | 06 | |
| | | නිවැරදි තාලරූප භාවිතය | 06 | |
| | | නර්තනය සමඟ උචිත ගායනය | 06 | |
| | **පළමු කොටස** | ප්‍රාසංගිකත්වය | 06 | |
| | | **පළමු කොටස - වාදනය** | | |
| | | සාම්ප්‍රදායික බව හා වාදන අක්ෂර නිරවද්‍යතාව | 06 | |
| | | අලංකාර පද වාදනය | 06 | |
| | | තාල නිරවද්‍යතාව | 06 | |
| | | වාදනය ශක්‍යතා | 06 | |
| | | ප්‍රාසංගිකත්වය | 06 | 30% |
| | | **දෙවන කොටස -නර්තනය** | | |
| | | සාම්ප්‍රදායික අනන්‍යතා ලක්ෂණ | 02 | |
| | | නිවැරදි අංගහාර භාවිතය | 02 | |
| | | නිවැරදි තාලරූප භාවිතය | 02 | |
| | | ශිල්පීය හැකියාව | 02 | |
| | | ප්‍රාසංගිකත්වය | 02 | |
| | **දෙවන කොටස -** | **දෙවන කොටස - වාදනය** | | |
| | | සාම්ප්‍රදායික බව හා වාදන අක්ෂර නිරවද්‍යතාව | 02 | |
| | | අලංකාර පද වාදනය | 02 | |
| | | තාල නිරවද්‍යතාව | 02 | |
| | | වාදනය ශක්‍යතා | 02 | |
| | | ප්‍රාසංගිකත්වය | 02 | 10% |

| | | | | |
|---|---|---|---|---|
| 2.3 | ප්‍රාසංගික කුසලතා ඉදිරිපත් කිරීම - උප ප්‍රධාන | **නර්තනය** | | |
| | | සාම්ප්‍රදායික අනන්‍යතා ලක්ෂණ | 05 | |
| | | නිවැරදි අංගහාර භාවිතය | 05 | |
| | | නිවැරදි තාලරූප භාවිතය | 05 | |
| | | ප්‍රාසංගිකත්වය | 05 | |
| | | **වාදනය** | | |
| | | වාදන අක්ෂර නිරවද්‍යතාව | 05 | |
| | | අලංකාර පද වාදනය | 05 | |
| | | තාල නිරවද්‍යතාව | 05 | |
| | | ප්‍රාසංගිකත්වය | 05 | 20% |
| 2.4 | නිර්මාණාත්මක කුසලතා ඉදිරිපත් කිරීම - උප ප්‍රධාන | නිර්මාණාත්මකබව | 10 | 15% |
| | | ප්‍රාසංගිකත්වය | 05 | |
| 2.5 | වාචික පරීක්ෂණය | | 15 | 15% |
| මුළු ලකුණු | | | | 100% |

**04 (Feedback) ප්‍රතිචාර ලබා ගැනීමේ ක්‍රමවේදය**

ප්‍රායෝගික පරීක්ෂණය සඳහා සහභාගී වන අපේක්ෂකයන් විසින් සහභාගීත්ව පහසුකම්, තොරතුරු සඳහා පිවිසීමේ පහසුකම්, පරීක්ෂණයේ ගුණාත්මක බව, ප්‍රමිතිය, අත්දැකීම, විශ්වාසනීයත්වය බව ශ්‍රේණිගත කරන තොරතුරු රැස්කිරීම පිණිස නිර්නාමික පත්‍රිකාවක් මගින් ප්‍රතිචාර (Feedback) ලබාගනී. මෙහි දී අපේක්ෂකයාගේ පෞද්ගලික තොරතුරු කිසිවක් ලබා නොගැනේ.

2026.05.06